# 3. ඉස්ලාමයේ වගකීම්

ඉස්ලාමයේ වගකීම් පහකි.

ඒවා නම්:

1. අල්ලාහ් හැර නැමදුමට වෙන කිසිවකු නොමැති බවත්, මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දැරීම
2. සලාතය නොකඩවා ම ඉටු කිරීම
3. Zසකාත් දීම
4. රමළානයේ උපවාස ශීලය රැකීම
5. පහසුකම් තිබෙන අය මක්කාවට ගොස් හජ් ඉටු කිරීම

මේවා ඉස්ලාමයේ කුළුණු බව හදීස් මගින් පැවසෙයි. එම හදීසය අරාබි භාෂාවෙන් ඉගෙන ගනිමු.

بُنِيَ الإِسْلَامُ عَلَى خَمْسٍ شَهَادَةِ

أَنْ لَا إِلَهَ إِلَّا اللهُ وَأَنَّ مُحَمَّدًا رَسُوْلُ اللهِ

وَإِقَامِ الصَّلَاةِ وَإِيْتَاءِ الزَّكَاةِ وَصَوْمِ رَمَضَانَ

وَحَجِّ الْبَيْتِ مَنِ اسْتَطَاعَ إِلَيْهِ سَبِيْلًا

## පැවරුම්

**පහත දී ඇති වචනවලින් සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.**

හජ්, Zසකාතය, උපවාසය, කලිමා, සලාතය

ඉස්ලාමය පිළිපදින කෙනකු මුල් වරට .............. කිව යුතු ය.

පසු ව පස්වේල් .................. ඉටු කළ යුතුයි. ............ දිය යුතුයි.

රමළාන් මාසයේ ............... රැකිය යුතුයි. පහසුකම් තිබෙන අය

............ ඉටු කළ යුතුයි.